## ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2017

---

ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2015 නොවැම්බර් 06 දින එළඹි අංක 5685 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ II උපලේඛනයේ II ඡේදයේ (ඇ) (3) හා 2010 ජුලි 31 දින එළඹි ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය හා ප්‍රදාන සාමාන්‍ය කොන්දේසිවල 4.09 (ආ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. තෝරාගත් දිස්ත්‍රික්කවල නළ ජල සේවා සහ වැඩිදියුණු කළ සනීපාරක්ෂක සේවා සඳහා ප්‍රවේශය වැඩිකිරීම හා සම්බන්ධිත ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 27,590 කට සමාන එජඩො මිලියන 183.9 ක් වන අතර ඉන් රු.මිලියන 24,750 කට සමාන එජඩො මිලියන 165 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2015 දෙසැම්බර් 07 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දැ

තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක අත්තිකාරම් හා එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(ඒ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්වාගණනය කල මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මතුවන බලපෑම් හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවේ පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව සහ,

(ඊ) මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජය විසින් නිරවුල් කරන ලද රු. මිලියන 69.15 ක් වූ ණය පොලිය ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකත්වය යටතේ දැක්වීම වෙනුවට විදේශ ණය යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති 2017 දෙසැම්බර් 31 දිනට වූ රු. මිලියන 6,812.31 ක විය පැහැදම එම දිනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගිය වාර්තාවල දක්වා තිබූ අනුරූප ශේෂය වූ රු. මිලියන 6,738.86 සමග එකඟවී නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු. මිලියන 2.66 ක් වූ වතු මානව සංවර්ධන අරමුදලේ සේවකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ඈ) තැලිගම නල එලීමේදී ඇතිවිය හැකි හානි මත මාර්ග සංවර්ධන අධිකාරියේ තබා තිබූ රු. මිලියන 1.79 ක නැවත ලබාගත හැකි තැන්පතු ව්‍යාපෘතිය විසින් සිදුකරනු ලැබූ තැන්පතු වශයෙන් දැක්වීම වෙනුවට සංවර්ධන වියදම් ලෙස කපාහැර තිබුණි.

(ඉ) මුලතිව් හි ප්‍රතික ප්‍රතිකාරක පිරියත ඉදිකිරිමේ නිරතව සිටි කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු. මිලියන 14.80 ක් වූ අත්තිකාරම් වටිනාකම, අත්තිකාරම් යටතේ දැක්වීම වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

### 2.2.2 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි වූ වත්කම් සටහන් කිරීම සඳහා වෙනම ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක ඩීඑම්එස්/7777/ඩබ්ලිව්එස්එස්අයිපී දරණ හා 2017 අගෝස්තු 29 දිනැති ලිපිය ප්‍රකාරව වසර 04 ක කොන්ත්‍රාත් පදනම මත වැඩසටහන් නිලධාරීන් 03 දෙනෙකු බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි. කෙසේ වෙතත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 01/2016 දරණ හා 2016 මාර්තු 24 දිනැති චක්‍රලේඛයේ ප්‍රතිපාදනයන්ට පටහැනි ලෙස රේඛීය අමාත්‍යාංශයට සම්බන්ධව සිටි නිලධාරීන් දෙදෙනකු ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය වෙත අර්ධ කාලීන පදනම මත නිදහස් කර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිලිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් 2017 වර්ෂය තුල | | උපයෝජනය කළ අරමුදල් 2017 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන |
| ජා සං සං | 165.00 | 24,750 | 3,500 | 20.76 | 3,114 | 23.70 | 3,554.14 |
| ශ්‍රී ලං ර | 5.00 | 750 | 75 | 0.46 | 69 | 0.72 | 108.59 |
| ප්‍රජා දායකත්වය | 13.90 | 2,090 | - | | - | - | - |
| **එකතුව** | **183.90** | **27,590** | **3,575** | **21.22** | **3,183** | **24.42** | **3,662.73** |

අයවැය ඇස්තමේන්තුව තුල ආංශික තාක්ෂණික සහය සංරචකය යටතේ 2016 හා 2017 වර්ෂයන් සඳහා පිළිවෙලින් රු. මිලියන 200 හා රු. මිලියන 300 ක් වෙන්කොට තිබුණද ඒ සම්බන්ධයෙන් කිසිදු කාර්යයක් ක්‍රියාත්මක කොට නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මුළු වෙන්කිරීම් වියදම් නොකොට පැවතුණි. තවද, නාගරික සනීපාරක්ෂාව සඳහා ප්‍රතීක ප්‍රතාකාරක පද්ධතිය වැඩි දියුණු කිරිම, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව සඳහා ආයතනික සහය ලබාදීම සහ වතු මානව සංවර්ධන අරමුදලේ ධාරිතාව ගොඩනැංවීම යන අරමුණු සඳහා එකතුව රු.මිලියන 275 ක් අයවැය ඇස්තමේන්තුව තුල වෙන්කොට තිබුණද කිසිදු කාර්යයක් ක්‍රියාත්මක කොට නොතිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘති කළමනාකරණ හා පරිපාලන කාර්යයන් සඳහා රු. මිලියන 400 ක් පමණක් වෙන්කොට තිබුණද රු. මිලියන 701.22 ක් වැය කොට තිබුණි.

**3.2** **භෞතික කාර්ය සාධනය**

-----------------------------

ව්‍යාපෘති ලියකියවිලි අනුව නාගරික, ග්‍රාමීය හා වතු ජල සැපයුම් හා සනීපාරක්ෂක යෝජනා ක්‍රම පුනරුත්ථාපනය කිරිම හා පුළුල් කිරිම, ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුවේ ධාරිතාවය ශක්තිමත් කිරිම , පුහුණුව ලබාදීම මඟින් ආංශික ධාරිතාවය වර්ධනය කිරිම හා ජලයේ ගුණත්වය සැලසුම් කිරිම හා ව්‍යාපෘති කළමනාකරණය හා පරිපාලනය යනාදී වශයෙන් සංරචක 04 ක් යටතේ ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කරන ලදී. ව්‍යාපෘති කාර්යයන් රත්නපුරය,කෑගල්ල,නුවරඑළිය,මුලතිව්,කිලිනොච්චි,බදුල්ල හා මොණරාගල යන දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කරනු ලැබේ.

පහත නිරික්ෂණන් කරනු ලැබේ.

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ වැලිපොතයාය ජල සම්පාදන යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු 2018 ජුනි 07 දින වන විට නිමකිරිමට සැලසුම්කර තිබුණද, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් 2018 මැයි 31 දිනට සියයට 24.20 ක මන්දගාමී භෞතික ප්‍රගතියක් පෙන්වා තිබුණි. තවද, ප්‍රජා මූල සංවිධානයන්හි ජල පරිහරණය සඳහා වූ ඉදිකිරිම් කටයුතු, භූගත ටැංකි, පොම්පාගාර, හා පැනල් බෝඩ් යනාදී කටයුතු සැලසුම්කළ පරිදි ආරම්භ කොට නොතිබූ අතර සියයට 50 ක් පමණ වූ නල එලීම් සම්පූර්ණ කොට තිබුණි.

(ආ) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ තොඩ්ඩුවාන්කොඩ්ඩි ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ඉදිකිරිම් කටයුතු සඳහා වූ කොන්ත්‍රාත්තුව රු. මිලියන 75.90 කට පිරිනමා තිබූ අතර එය 2018 ජුනි 10 දින වන විට නිම කිරීමට සැලසුම් කොට තිබුණි. කෙසේ වෙතත් වැඩ කාල සටහනට අනුව බට එලීම් මීටර් 9,815 සිදු කිරීමට සැලසුම් කොට තිබුණද 2018 ජුනි 15 දිනට බට එලීම් කටයුතු මීටර් 9,173 ක් පමණක් නිමකොට තිබුණි.

(ඇ) පිරිවැය රු. මිලියන 78.70 ක් වූ මුලතිව්හි ප්‍රතීක ප්‍රතිකාරක පිරියත ඉදිකිරිම සඳහා වූ කොන්ත්‍රාත්තුවේ කාලය සැලසුම් කොට තිබූ කාලපරිච්ඡේදයේදී වැඩ කටයුතු ආරම්භ කිරිමට කොන්ත්‍රාත්කරු අපොහොසත්වීම හේතුවෙන් 2018 ජුනි 18 වන දින තෙක් කාලය දීර්ඝ කොට තිබූ අතර 2018 මැයි 31 දිනට එහි භෞතික ප්‍රගතිය සියයට 12 ක් පමණක් වශයෙන් වාර්තා වී තිබුණි. වැඩ ආරම්භ කිරිම ප්‍රමාදවීම හේතුවෙන් 2018 මැයි 31 දිනට වටිනාකම රු.මිලියන 14.30 ක් වූ සේවයේ යෙදවිය හැකි අත්තිකාරම් වර්ෂයකට වැඩිකාලයක් කොන්ත්‍රාත්කරු විසින් රඳවා ගෙන ඇති බව නිරික්ෂණය විය.

(ඈ) කිලිනොච්චි හි ප්‍රතීක ප්‍රතිකාරක පිරියත ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2017 පෙබරවාරි 17 දිනෙන් ආරම්භවී මාස 09 ක කාලයක් සඳහා රු. මිලියන 74.08 ක පිරිවැයකට කොන්ත්‍රාත්කරුට පිරිනමා තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් කාලය තුල කොන්ත්‍රාත් කාර්යයන් නිම කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වූ අතර 2018 මාර්තු 17 දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කොට තිබුණි. තවද, 2018 ජුනි 13 දින සිදුකල භෞතික පරීක්ෂාවේදී

අනාවරණය වූ පරිදි කොන්ත්‍රාත්තුවේ සත්‍ය භෞතික ප්‍රගතිය සියයට 50 ක් ව පැවතුණු අතර ඉදිකිරීම සඳහා තෝරාගත් පරිශ්‍රය කලින් කලට ඇතිවන ගං වතුරට භාජනය වන අතර ඒ වෙනුවෙන් මායිම් තාප්පයක් ඉදිකිරීම සඳහා රු. මිලියන 2.87 ක අතිරේක පිරිවැයක් අනුමත කොට ගෙන තිබුණි.

(ඉ) නුවරඑළිය වතු සනීපාරක්ෂක යෝජනා ක්‍රමය යටතේ පොදු හා පෞද්ගලික වැසිකිළි 2,595 ක් ඉදිකිරීම සඳහා රු. මිලියන 49.54 ක් වතු සේවක සමුපකාර සමිති වෙත කාර්ය සාධන බැඳුම්කර ලබාගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘතිය විසින් නිදහස් කර තිබෙන බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් 2017 දෙසැම්බර් 31 දිනට වැසිකිලි 307 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 12.28 ක් පමණක් උපයෝජනය කර ඇති බවත් වැසිකිලි 2,288 ක් ඉදිකිරීම සඳහා වෙන් කල රු.මිලියන 37.26 ක් අපේක්ෂා කල අරමුණු සඳහා උපයෝජනය කිරිමකින් තොරව මාස 18 කට වැඩි කාලයක් සමුපකාර සමිති වෙත රඳවා තබා ගෙන තිබුණි. ඊට අමතරව "ඩන්සිනන් වතු සමුපකාර සමිතිය " නම්වූ වෙනත් සමුපකාර සමිතියක් හරහා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට රු. මිලියන 3.3 ක් අත්තිකාරමක් ගෙවා තිබූ අතර රු. මිලියන 1.42 ක වටිනාකමකින් යුතු වැඩ සම්පූර්ණ කිරීමකින් පසුව අදාල ඉදිකිරීම අතහැර දමා තිබුණි. කෙසේ වෙතත් එම අලාභය ආවරණය කර ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ) කාර්ය සාධන වාර්තාව අනුව කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සනීපාරක්ෂක පහසුකම් සැපයිය යුතු ප්‍රතිලාභීන් 2,184 ක් හඳුනාගෙන තිබූ අතර කිලිනොච්චි සනීපාරක්ෂක යෝජනාක්‍රමය යටතේ ප්‍රදේශය තුල ඇති සමුපකාර සමිති 09 වෙත වැසිකිලි 541 ක් ඉදිකිරීම සඳහා රු. මිලියන 13.58 ක් නිදහස් කොට තිබුණි. කෙසේ වෙතත් 2018 ජුනි 15 වන විට පිරිවැය රු.මිලියන 12.03 ක් වන වැසිකිළි 214 ක ඉදිකිරීම් කටයුතු නිමකොට තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

2017 දෙසැම්බර් 31 වන විට ඉංජිනේරු , අභ්‍යන්තර විගණක , ගණකාධිකාරි හා සමාජ විද්‍යාඥ වැනි ප්‍රධාන තනතුරු ඇතුළු තනතුරු 13 කට අදාල පුරප්පාඩු පිරිවීම සඳහා වසර දෙකකට වැඩි කාලයක සිට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද, 2016 මාර්තු 24 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 1/2016 දරණ චක්‍රලේඛයට පටහැනිව පිටස්තර ආයතනවල සේවකයින් 71 දෙනෙකු ව්‍යාපෘතිය විසින් සේවයෙහි යොදවා තිබූ අතර ඔවුන්ගේ වැටුප් හා වෙනත් දීමනා සඳහා සමාලෝචිත වර්ෂය තුල ව්‍යාපෘතිය විසින් රු.මිලියන 13.4 ක මුදලක් වැයකර තිබුණි.

## 3.4 පරිබාහිර වියදම්

2017 ජුනි 10 වන දින සිට 2017 ජුනි 14 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුල ඉන්දුනීසියාවේ පැවැත්වූ පුහුණු වැඩ සටහනකට සහභාගිවීම සඳහා නිලධාරීන් 10 දෙනෙකුගේ සහභාගීත්වය වෙනුවෙන් රු.මිලියන 6.13 ක් වැය කොට තිබුණද, ඔවුන් ව්‍යාපෘති කාර්යයන්ට සම්බන්ධ නොවන බව නිරීක්ෂණය විය.